
ලංකාවිත්ති
LANKA VITHTHI

**LANKA VITHTHI**
**P.O.BOX 14373**
**LONDON NW6 3WU**
**ENGLAND**

*Phone & Fax* **: 020 7428 9388**
E-mail **: lanka.viththi @ virgin.net**

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : **Daya Ananda Ranasinghe**

චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam

## යුද්ධයේ අවසානය අත ළඟය!

වීරෝධාර ශ්‍රීලංකා සන්නද්ධ හමුදාවන් හි 57, 58, 59 සේනාංක අද උදෑසන කිලිනොච්චිය ප්‍රදේශයට ඇතුල්වූ බව සැළවිය. කිලිනොච්චිය කොතරම් ප්‍රසිද්ධියට පත්ව ඇද්දැයි කිවහොත් වැඩිපුර ඉංග්‍රිසින් හා යුරෝපීයයන් ලංකාවෙන් දන්නේ කොළඹ හා කිලිනොච්චිය යන ස්ථාන දෙක පමණකි. මෙච්චර කල් කොටි සංවිධානය ලෝකයාට පෙන්වූ උන්ගේ හෙඩ්ක්වාටර්ස් (මූලස්ථානය) මෙයයි. ප්‍රභාකරන් කොටි සූට්එක හා සයනයිඩ් කරල ගලවා තබා, බුෂ් කෝට් එකක් ගහගෙන චිත් එරික් සොල්හයිම්ලාට අතට අත දුන්නේ මේ අස්සක ඇති ගොඩ-නැගිල්ලක සිටයි. මැරුණු තමිල් චෙල්වම් පොල්කෑල්ල පෙන්නා කාටත් විරිත්තුවේ මෙහි සිටයි. එලොව ගිය බාලසිංහම්ලා සාකච්ජා පැවැත්තුවේ මේ ස්ථානයේයි. මේ අවුරුදු ගණ-නාවකට පසු රජයේ හමුදා කිලිනොච්චියට ඇතුල්වූ ප්‍රථම වතාවයි.

සන්නද්ධ හමුදා පැති ගණනාවකින් වෙන වෙනම සේනාංක ලෙස සැදී කිලිනොච්චියට කඩාවැදීම නිසා විකෂිප්තවූ කොටි තම ආයුධ හා කෑම සියල්ල පසෙක දමා, වෙඩිවැදුණු තම සගයන් ගේ මළසිරුරු හා තුවාලකරු-වන්ද අතැරදමා කඩිමුඩියේ දිවි ගලවාගෙන දිවගොස් ඇති හැටි ආරකෂක හමුදා විඩියෝ පට අනුසාරයෙන් අපි දුටුවෙමු. මේ ගෙවෙන්-නේ අවසාන පැයබව නිසැකය. ප්‍රභාකරන් මහ කොටියා දැන් වෙව්ලනවා ඇතියි සිතිය හැක.

මේ අවසාන අදියර බිහිසුණු එකක් වෙන බවට සැක නැත. කාඩරයන් හිඟ නිසා කොටි සංවිධානය කොටි පොලිස් භටයන්ටද තුවක්කු දී සටනට යවා තිබේ. වැඩියෙන්ම මියයන්නේ සටන් නුහුරු උන්ය. කොටින්ගේ ධෛර්‍යය දැන් බිංදුවට බැස ඇති බව ලන්ඩනයේ ද්‍රවිඩයෝම කියති. හෙට අනිද්දා කොටින්ට අන්ත පරාජය අත්වන බව ඔව්හු අකමැත්තෙන් වුවද කියති.

මේ අතරේ ප්‍රභාකරන් නෝර්වේ උදව්වෙන් රටින් පැනයන්නට තැත්කරන බවක්ද ඉව වැටී ඇත. කිලිනොච්චි ක්‍රියාන්විතයේදී අපප හමුදාව ඒ ගැන විශේෂ අවධානයකින් සිටින බව ද නිසැකය. උදේ සිට වතුර ඇද හැන්දෑවේ කළය බිඳගන්නට හමුදාව ඉඩ සළසාගනී ද?
පරදින කොටින්ට යළි ජීවන හුස්ම පිඹින්නට කොටි හිතවාදී **NGO** නඩේ ද, කොටි සාක්කු-වට වැටුණු ඊණියා මාධ්‍යකාරයින්ද, සාම කාක් කන්ද මහන්සි ගන්නා හැටි පෙනේ. ඒ අතරේ මේ පැරදිගෙන යන කොටියා මෙන්න දැන් සාම සාකච්ජාවට කැමති බවද කියයි. මේ කිසි වක් තඹයකයවත් ගණන් නොගෙන ආරකෂක හමුදා එක් එල්ලේ බලාගෙන කොටි හැතිකරය ශ්‍රීලංකා භූමියෙන් සදහටම තුරන්කර දමන අධිශ්ඨානයෙන් සටන්වැද සිටීම රටේ ද ජාති-යේ ද භාග්‍යයකි. මේ සියල්ලට අවශ්‍ය චිත්ත ධෛර්‍යය හා පූර්ණ සහාය ලැබෙන්නේ රටේ ඉහළම තැනිනි. නායකත්වයෙනි. මින්පෙර සිටි ජනාධිපතිවරුන් යුද්ධ කළ හැටි අපි දුටුවෙමු. ඔවුන්ගේ දුර්වල අදක්‍ෂ පාලනය නිසා මේ යුද්ධය වසර 30 ක් තිස්සේ මේ තාක් ඇදී ආවේය. ජනාධිපති රාජපක්‍ෂ මහතාටද, හමුදා විරුවන් සියල්ලන්ට ද නිසැකවම ජාතියේ ප්‍රණාමය හිමිවේ. ජයෙන් ජයවේවා!

# ඉසිපතනේ ඇසළ ඇසිරි



ඇසළ පුන් සඳින් බබලන
නිසල ගගන තලය පුරා
සකල දෙව් බඹුන් සේනා
විසුල මල් දමින් //

සුව ඳවත් වුණා බරණැස
එව නැ විසුව මිහිලොල් රැස
මුව ද ගෝන මොණර ගිරා
සව න් සැනසුණා //

බර ණැසෙහි එදා දඹදිව
අර මැ ඉසිපතන් හී හිඳ
සුර න් ඇතුළු පස්වග වෙත
සර ණ වනු පතා //

නොහිම් දයාවෙන් සත වෙත
පෙරුම් පුරා බුදුබව ලැබ
ද හ ම් සක් පවත් සුතුරෙන්
උ තු ම් බණ දෙසී //

සනා තනව වෙර බැඳගත්
අනා දර උරඟ මැඩි කැල
වුණා සමගි සදහම් දිය
උනා දෙසවනේ //

මිහිරි ඒ දහම් රස ගඟ
පැතිරී ගොස් සතන් මුළු ගත
බිහිරි බව වුණා කෙලවර
අසිරි යක හැටී //

අන්ධ කාරයෙහි සිටි දන
වින්ද දුක් ගෙවා සදහට
අන්ධ බව නසාගති බණ
රන්ද වා සිතේ //

බින්ද සසලබව සා කැල
වින්ද නිසාවෙනි දම් රස
ලන්ද පුරා වෙනදා නැති
සුන්ද රත්වයක් //

ප වි න් සසර දී සිදු කළ
උ ප න් දා සිටම නොදොඩන
ගොළුන් සාදු නද දුනි හා!
එ ව න් අසිරියක්! //

පෙම් කෙළිමින් දුව ඇවිදින
අ ං දිග මුව ගෝණ රැලක්
ස න් සුන් වී මේ ඉන්නේ
ම න් ද නොදන්නේ //

විල් වල මල් මත බමරුන්
කුල් මත් වී නද දුන්නේ
මල් පැණි බීමෙන් ඇති වූ
ලොල් බවෙන් නොවේ //

සි ව් දිග නද පතුරුවමින්
කි ච්ච ගීතිකා නවතා
බ වුන් වැඩූ ලෙස ඉන්නේ
කොවුලනේ මොකෝ ? //

රංචු පිටින් සිටි ඇත් රැළ
ළංව ඉසිපතන් අරමට
අංගී රස ගුණ ගැයූ හැටි
කුංච නාදයෙන් //

නිමා වක් නොමැත හිමි ගුණ
පමා වෙන් සිදුවූ වරදට
සමාව අප සැමට දෙවනු
මැනව සමිඳුනේ //

*ත්‍රිපිටකවේදී ශාස්ත්‍රපති*
♦ *පූජ්‍ය මිගස්තැන්නේ රතනජෝති හිමි*
*සුනන්දාරාමය ගම්පහ* **Sri Lanka**

# මේ මොහොත .... This Moment ....

A Japanese warrior was captured by his enemies and thrown into prison.
That night he was unable to sleep because he feared that the next day he would be interrogated, tortured, and executed.
Then the words of his Zen master came to him,
" Tomorrow is not real. It is an illusion. The only reality is now."
The Master had said.
Heeding these words, the warrior became peaceful and fell asleep.



**ජ**පානයේ රණශූරයෙකු සතුරන් අතට අසුවී සිරකර තබන ලදී. එදා රැයේ ඔහුට යාන්තම් හෝ නිදාගත නොහැකිවීය. පසුදා එළිවූ පසු තමාට අත්වන ඉරණම ගැන ඔහු දිගින් දිගට කල්පනා කළේය. සතුරන් ඔහුගෙන් දිගින් දිගටම ප්‍රශ්න කරනවා ඇත. ඉන් පසු වධ දී, අවසානයේ හිස සිඳ මරණයට පත්කරනවා ඇත. මෙසේ කල්පනා කළ ඔහුට බිඳක් හෝ නින්ද ආවේ නැත. ඒ අතරේ ඔහුට තම සෙන් ගුරුවරයා කලින් පවසා තිබූ වදනක් සිහිපත් විය. " හෙට දවස සැබෑවක් නොවේ. එය මායාවකි. සබෑව ඇත්තේ දැන්, මේ මොහො තේය. තවමත් නා හෙට ගැන දැන් ලතවන් නේ කුමටද ? " ගුරුවරයාගේ ඒ වචන සිතට ගනිත්ම රණශූරයාගේ සිත තැන්පත් විය. ඔහු ඉක්මනින් ම සන්සුන්ව නින්දට වන්නේ ය.

♦ ***කිත්සිරි මෙවන්***

## ❊ නව සහශ්‍රයට ධර්මානුශාසනා ❊

### *හිතොපදේශයෙන්*

**චන්දන තරුෂු භුජඞනා ජලෙසු කමලානි තත්‍ර ච ග්‍රාහා:**
**ගුණඝාතිණශ්ච භොගෙ බලා න ච සුඛන්‍ය විස්නානි**

***අර්ථය** : සඳුන් ගස්වල සර්පයෝ වෙති. ජලයේ පියුම් හා කිඹුල්ලුද වෙති. සම්පත් ඇතිවිට ගුණ වනසන්නෝ ද, පව්ටෝ ද වෙති. උවදුරු නැති සැපතක් නැත.*

***මෙ**ම පද්‍යයෙන් විස්තර කරන්නේ උවදුරු වලින් තොර සැපයක් සොයාගැනීම දුෂ්කර බවයි. යමෙක් සැපයක් විඳින් නේ නම් එය හුදු සැපයක්ම නොවේ. එහි රස මෙන්ම නීරස බවක් ද ඇත. රස නීරස මෙන් ම, දුක හා සැප ද මිශ්‍රව පවතින්නේය. කෙනෙකුට දුක පමණක් නොව සැපතද, සැප පමණක් නොව දුක ද අඩු වැඩි වශයෙන් උරුමවීම ලෝක ස්වභාවයයි.

නිවැරදිව අප අප දෙස ම බලන්නේ නම් අප සැප සොයන්නට ගොස් විඳින දුක්වල සීමාවක් තිබේදැයි කල්පනාකරන්න. ගංවතුර, සුළි සුළඟ, ඉඩෝර, බෝම්බ, වෙඩි උණ්ඩ, ගහබැණගැනීම්, නින්දා අපහාස හා අලාභ හානිවල කෙලවරක් නැත. ලෙඩ දුක්වල ප්‍රමාණයක් නැත. හැමදෙනාගේම ලෞකික ජීවිතයේ පරමාර්ථය නම් ලෙඩ දුක්, කරදරවලින් තොරව පොහොසත් වී සුවසේ ජීවත්වීමයි. බැරි පුළුවන්කම කෙසේ වෙතත් හැමෝගේම බලාපොරොත්තුව එයයි. නමුත් සැප සොය සොයා දුවනවාට වඩා, තමන් ඉන්නා තැන දුකක් නැතිව ඉන්න හදාගන්නවා නම් වඩාත් හොඳය. සැප සොයා දිවීමේදී පීඩාව හා රිදුම වැඩිය. ලද පමණින් ජීවත්වීමට හිත සකසාගැන්මට පුළුවන් නම් එය කොතරම් අගනේද? අනවශ්‍ය දුක් ඇතිකරන බලාපොරොත්තු හොඳ නැත. ලද පමණින් ජීවත්වීම හොඳය.

එනමුත් ඇතැම් අය ජීවිතයේ අවුරුදු සිය ගණනක සැලසුම් හදාගෙන, ඒවා ඉටුකරගන්නට දිවා රෑ නොබලා වැයම් කරන සැටි අපි දකිමු. ඔවුන්ගේ වැඩවල කෙළව රක් නැත. කන්න බොන්න හෝ කතාබහ කරන්නට වෙලාවක් නැත. අද ලෝකයාගේ සැබෑ තත්වය එයයි.

වෙනත් අය ළඟ නැති සැප සම්පත් තමා ළඟ නැති වුනත් අසීමිත වටිනාකමක් ඇති සැනසිල්ල තමා ළඟ තිබෙනවාය කියා සතුටුවන්නට පුළුවන් නම් එය ඉතා වටිනා දෙයකි. වැඩි වැඩියෙන් සැපසම්පත් ලබන්නට වැයම් කරන්නන් වේදනා පසුතැවිලි මැද නොනිදා සිටියත්, සැනසිල්ලෙන් සතුටින් ජීවත්වන පුද්ගලයාට ඉතා සුවසේ නිදාගත හැකි බව ඔබත් දන්නවා ඇත. එවන් අයට පකෂියෙකු සේ නිදහසේ ජීවත්විය හැකියි. එනිසා භෞතික සැප සම්පත් විශාල වශයෙන් නැතත් සැනසිල්ල තමා සතුව පවතිනවා යයි සිතා සතුටු වන්න!

බාහිර ලෝකය තුළ දුක හෝ සැපයයි දෙයක් දැක්විය නොහැක. දුක හා සැප විඳින ගතිය ඇත්තේ අප තුළම ය. තම තමන්ගේ අතපසුවීම් වලින්, වැරදීම් වලින් සිදුවන පීඩාවන්ට බාහිර ලෝකය පලි නැත. ඒ බව තේරුම්ගත යුතුයි. එසේ තේරුම් නොගතහොත් අප අනන්ත දුක් පීඩාවලට ගොදුරුවෙනවා ඇත.

ඉහත පද්‍යයේ සඳහන්වන ආකාරයට සඳුන් ගස කොතරම් අගනා ගසක් වුව ද, එය විෂඝෝර සර්පයන්ද වසන්නාවූ ගසකි. ජලයේ ඉතා අලංකාර නෙළුම් මල් පිපෙතත් එහි ඉතා දරුණු කිඹුල්ලු ද වෙසෙති. ඒ අනුව කෙනෙකුට සැපසම්පත් ලැබුණු විට ඔහුට ඒවා පරිභෝජනය කිරීමට ඉඩ නොතබා ඔහුගේ ගුණ විනාශකරන්නන් ද, අයහපත සලසන පව්ටුන් ද ඔහු වටා එකතු වෙනවා ඇත. මේ කාරණා අනුව ජීවිතය දෙස බලන්න. අප විඳින සැපය කිසිදාක සර්වසම්පූර්ණ එකක් නොවන බවත්, එය සමග උවදුරුද එන බවත් සිතට ගෙන කල්පනාකාරීව ජීවත්වන්න!



♦ ***පූජ්‍ය විල්ඹය විමලජෝති හිමි***
**ලන්ඩන් බෞද්ධ විහාරය**
**London Buddhist Viharaya**
**The Avenue, London W4 1UD**


**ANOOMA & HEGODA**
**Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772**

**Colombo Office**
**Visa Refusals**
**Property Purchase in Sri Lanka**
**Hegoda & Hegoda**
**100/6 Rosemead Place**
**Colombo 7**
**Tel. 2672432 / 0777686632**